රු5000.00

203079
ව
2013.01.17

# කොළඹ නගරයේ මත් ද්‍රව්‍ය වැරදි වලට සම්බන්ධවන පැල්පත් සහ මුඩුක්කුවාසී කාන්තාවන් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය

රයිගමගේ හසිතා ජයන්ති පෙරේරා

11 FEB 2011

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා සමාජ විද්‍යා විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය

Libary - USJP
203079

203079

# පටුන


පිටු අංකය

1. පටුන i - vii
2. ස්තුතිය viii - ix
3. සාරාංශය x - xiii

**පළමුවන පරිච්ඡේදය**

**හැඳින්වීම-**

1. 1. පර්යේෂණ ගැටළුව 3 - 4
1. 2. අධ්‍යයනයේ අරමුණ 4 - 5
1. 3. ක්‍රම වේදය 5 - 10
1. 4. පර්යේෂණ සීමාවන් 10
1. 5. අධ්‍යයනයේ සැලැස්ම 10 - 11

**දෙවන පරිච්ඡේදය**

**මාතෘකාවේ සංකල්ප විග්‍රහය**

2. 1. නගරය සහ නාගරික සමාජය හඳුනා ගැනීම 13
2. 2. නගරය සහ නාගරීකරණය 13- 15
2. 3. නාගරික සමාජය සහ එහි ලක්ෂණ 15 - 17
2. 4. කොළඹ නගරය සහ එහි සමාජ රටාව 17 - 18
2. 5. සමාජය 18 - 19
2. 6. පැල්පත් සහ මුඩුක්කු 19
2. 7. මුඩුක්කු සහ මුඩුක්කු සමාජයේ ලක්ෂණ 19 - 20
2. 8. පැල්පත් සහ පැල්පත් සමාජයේ ලක්ෂණ 20 - 21
2. 9. මුඩුක්කු සහ පැල්පත් සමාජයේ සමාජීය ලක්ෂණ 21 - 22
2. 10. කොළඹ නගරයේ පැල්පත් සහ මුඩුක්කු සමාජය 22 - 24

2. .11. මත් ද්‍රව්‍ය 24 - 26

2. 12. වැරදි 26

2. 13. අපරාධ 27 - 31

**තෙවන පරිච්ඡේදය**

**මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ජාත්‍යන්තර පසුබිම**

3. 1. මත් ද්‍රව්‍ය ඉතිහාසය 33 - 34

3 .2. මත් ද්‍රව්‍ය වල ස්වභාවය 34 - 40

3 .3. ඇබ්බැහිවීම 41 - 45

3 .4. ප්‍රධාන මත් ද්‍රව්‍ය වර්ග 45 - 61

3 .5 මත් ද්‍රව්‍ය භාවිතය සහ කාන්තාව 61 - 69

3 .6 ජාත්‍යන්තර මත් ද්‍රව්‍ය වෙළඳාම 69 - 72

3. 7 ස්ත්‍රී පුරුෂ භේදය අනුව ජාත්‍යන්තර මත් ද්‍රව්‍ය භාවිතය 72 - 78

3 .8 මත් ද්‍රව්‍ය භාවිතයට හේතු 78 - 88

3. 9. මත් ද්‍රව්‍ය මගින් මනසට ඇතිවන හානිකර බලපෑම් 88 - 90

3. 10.මත් ද්‍රව්‍ය භාවිතයෙන් ළමා පරපුරට සිදුවන අහිතකර බලපෑම් 90 - 94

3 .11. මත් ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් අපරාධ සිදුවීම 94 - 97

3. 12. මත් ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන රිය අනතුරු 97 - 98

3. 13. මත් ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග 98 - 104

**සිව්වන පරිච්ඡේදය**

**මත් ද්‍රව්‍ය සහ ශ්‍රී ලංකාවේ අත් දැකීම්**

4 .1. ලංකාවේ මත් ද්‍රව්‍ය ඉතිහාසය 105-107

4. 2. ශ්‍රී ලංකාවේ මත් ද්‍රව්‍ය භාවිතා වන ස්වරූපය 107-109

4. 3. ශ්‍රී ලංකාවේ මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පොදු කරුණු 109-116

4. 4. ශ්‍රී ලංකාවේ මත් ද්‍රව්‍ය භාවිතය සහ සිරගතවීම් 116-120

4. 5. ශ්‍රී ලංකාවේ මත් ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් අපරාධ සිදුවීම 120

4. 6. කාන්තා මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලංකාවේ නඩු වාර්තා 120-122

4. 7. ශ්‍රී ලංකාව තුල මත් ද්‍රව්‍ය උවදුර මැඩලීම 123-125

4. 8. ශ්‍රී ලංකාවේ මත් උවදුර මැඩලීමට ඇති බාධක 125-126

**පස්වන පරිච්ඡේදය**

**දත්ත විශ්ලේෂණය, සිද්ධි අධ්‍යයන සහ විශ්ලේෂණ**

5 . 1. දත්ත විශ්ලේෂණය 127-162

5 . 2. සිද්ධි අධ්‍යයන 163-194

5 . 3. සිද්ධි අධ්‍යයන පිළිබඳ විශ්ලේෂණ 195-200

**හයවන පරිච්ඡේදය**

**නිගමන සහ යෝජනා**

6 . 1. නිගමන 201-204

6 . 2. යෝජනා 204-205

ආශ්‍රිත ග්‍රන්ථ 206-218

**ඇමිනුම්**

1. පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රශ්ණාවලිය i - ix

**වගු**

1. 1. බන්ධනාගාරගත කාන්තාවන් පිළිබඳ තොරතුරු 1

3. 7. 1. - ස්ත්‍රී පුරුෂ භේදය සහ මත් ද්‍රව්‍ය වර්ග අනුව භාවිතය 72

3. 7. 2. - ස්ත්‍රී පුරුෂ භේදය සහ මත් ද්‍රව්‍ය වර්ග අනුව භාවිතය 73

3. 7. 3. - ස්ත්‍රී පුරුෂ භේදය සහ මත් ද්‍රව්‍ය වර්ග අනුව භාවිතය 74

3. 7. 4. - ස්ත්‍රී පුරුෂ භේදය සහ මත් ද්‍රව්‍ය වර්ග අනුව භාවිතය 76

3. 7. 5. - ස්ත්‍රී පුරුෂ භේදය සහ මත් ද්‍රව්‍ය වර්ග අනුව භාවිතය 77

# කොළඹ නගරයේ මත් ද්‍රව්‍ය වැරදි වලට සම්බන්ධ වන පැල්පත් සහ මුඩුක්කු වාසී කාන්තාවන් පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහය

රයිගමගේ හසිතා ජයන්ති පෙරේරා

## නිබන්ධ සාරාංශය

කොළඹ නගරයේ මත් ද්‍රව්‍ය වැරදි වලට සම්බන්ධ වන පැල්පත් සහ මුඩුක්කු වාසී කාන්තාවන් පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් යන මැයෙන් සිදුකළ අධ්‍යයනයේදී එවැනි මාතෘකාවක් තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වූයේ කාලීන සමාජ ප්‍රශ්ණයක් වූ මත් ද්‍රව්‍ය උවදුර සමාජයේ ව්‍යවසනයක් ලෙස පැතිර යාමත්, තරුණ පරපුර මෙන්ම ළමා පරපුරද එයට දැඩි ලෙස ගොදුරු වී තිබීමත් හේතුවෙනි. මේ පිළිබඳව කරුණු සෙවීමේදී සංඛ්‍යා ලේඛන වලින් පැහැදිලි වූයේ කොළඹ නගරයේ ජනතාව මේ පිළිබඳ වැඩි පෙළඹවීමක් ඇති බවත්, කාන්තාවන් සහ ළමයින් ද මේ සඳහා බහුලව සම්බන්ධ වී ඇති බවත්ය. බන්ධනාගාර සංඛ්‍යා ලේඛන වාර්තා වලත්, පොලිස් වාර්තා වලත් සඳහන් තොරතුරු වලින් මේ බව පැහැදිලි විය. තවද දෛනිකව පුවත් පත් සහ වෙනත් මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් වන තොරතුරු වලින්ද මෙය සමාජ ප්‍රශ්ණයක් ලෙස කැපී පෙනුනි. එනම් සොරකම්, අපරාධ සහ ස්ත්‍රී දූෂණ වැනි අපචාරී ක්‍රියා මත් ද්‍රව්‍ය හේතුවෙන් බහුලව සිදුවන බව එම තොරතුරු වලින් හෙලිවේ. පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ද මේ සඳහා වැඩි පෙළඹවීමක් ඇති වීම හේතුවෙන් එම තත්වය උද්ගත වීමට හේතු සොයා බැලීම සහ මෙම තත්වය ඇතිවීම හේතුවෙන් ඇතිවන විපාක පිළිබඳව සොයා බැලීම පිණිස ඉහත කී මාතෘකාව ඔස්සේ අධ්‍යයනයක් සිදු කිරීම ඵලදායි ක්‍රියාවක් සේ සලකා පශ්චාත් උපාධි අධ්‍යයනයේ නිබන්ධය සඳහා ඉහත මාතෘකාව තෝරා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සිදු කිරීමේදී ප්‍රාථමික මූලාශ්‍රයන් මෙන්ම ද්විතීක මූලාශ්‍රයන්ද උපයෝගී කර ගන්නා ලදී.

මෙහිදී මත් ද්‍රව්‍ය ලෙස සත්වයින් මත් කරවන සත්ව හැසිරීම් වෙනස් කරවන ද්‍රව්‍ය මත් ද්‍රව්‍ය ලෙස හැඳින්වෙන අතර මේ සඳහා නීතිමය, වෛද්‍ය විද්‍යාත්මක සහ උද්භිත විද්‍යාත්මක ආදී වශයෙන් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ නිර්වචන ඉදිරිපත් වී ඇත. මෙම ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් මිනිස් හැසිරීම් වෙනස් වී, මිනිසා විසින් සමාජයේ අසම්මත දේ සිදු කිරීම

නිසා මත් ද්‍රව්‍ය භාවිතය සමාජ ප්‍රශ්නයක් වී ඇති ආකාරය, මත් ද්‍රව්‍ය වල ස්වභාවය සහ සමාජයේ අසම්මත දේ වරදක් වන ආකාරය පිළිබඳ විග්‍රහ කිරීමෙන් පැහැදිලි වේ. මෙම තත්ත්වය තේරුම් ගැනීම සඳහා වරදක් යනු කුමන තත්වයක් සලකන්නේද යන්න මෙම නිබන්ධයේදී විග්‍රහ වේ.

මේ සඳහා යොදා ගත් සමාජ රාමුව පැල්පත් සහ මුඩුක්කු සමාජයයි. මත් ද්‍රව්‍ය පිළිබඳ වැරදි සමස්ත සමාජය පුරාම පැතිර පවතින්නකි. එහෙත් කොළඹ නගරයේ පැල්පත් සහ මුඩුක්කු වාසීන් මේ සඳහා වැඩි ප්‍රවණතාවයක් දරයි. මේ හේතුවෙන් මෙම සමාජ රාමුව මෙම නිබන්ධය සඳහා යොදා ගත් අතර පැල්පත් සහ මුඩුක්කු යනු වෙනම සංස්කෘතියක් බවද හඳුනා ගෙන ඇත.

කොළඹ නගරය මේ සඳහා කැපී පෙනෙන ප්‍රදේශය වූ බැවින් කොළඹ නගරයත්, නාගරික පරිසරයක් යනු කුමක්ද යන්නත්, එහි විශේෂ ලක්ෂණ පිළිබඳවත්, එම උප සංස්කෘතික ලක්ෂණ සහ මත් ද්‍රව්‍ය වැරදි සඳහා පවත්නා සබඳතාවයන් මෙහිදී සලකා බලනු ලැබිණ.

කාන්තාවන් සම්බන්ධ වි ඇති මත් ද්‍රව්‍ය වැරදි පිළිබඳ සලකා බැලීමේදී ලෝකයේ විවිධ රටවල විවිධ සමාජ වල කාන්තාවන් මත් ද්‍රව්‍ය වැරදි සඳහා බැඳී ඇති ආකාරය මෙහිදී සාහිත්‍ය විමර්ශන තුළින් විග්‍රහ කර ඇත. පුරාතන යුග වලදී පටන් මත් ද්‍රව්‍ය සමාජ ගතවූ ආකාරයත්, එහි ව්‍යාප්තියත්, එය සමාජ ගැටළුවක් වූ ආකාරයත් මෙම විමර්ශන වලදී පැහැදිලි විය. මෙම ගැටළුවේ ලෝක ව්‍යාප්තිය පිළිබඳව අවබෝධයක් සහිතව කොළඹ නගරයේ මත් ද්‍රව්‍ය වැරදි වලට සම්බන්ධ වන පැල්පත් සහ මුඩුක්කු වාසී කාන්තාවන් පිළිබඳ අධ්‍යයනය සඳහා කොළඹ වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයේ මත් ද්‍රව්‍ය වැරදි වලට සම්බන්ධ වී ඇති පැල්පත් සහ මුඩුක්කු වාසී කාන්තාවන් අතරින් සමාජ පර්යේෂණය ආරම්භ කරන ලදී.

මෙම පර්යේෂණය සඳහා ඉලක්ක ගත කණ්ඩායම තුලින් සසම්භාවී නොවන ආකාරයෙන් කාන්තාවන් 50 දෙනෙකු පර්යේෂණයට සම්බන්ධ කරගන්නා ලදී. මෙහිදී ජාතීන් සහ ආගම් නියෝජනය වන පරිද්දෙනුත් , මත් ද්‍රව්‍ය ජාවාරම සහ භාවිතය නියෝජනය වන ආකාරයෙනුත්, පර්යේෂණයට භාජනය කරන ලදී. අනතුරුව මෙම 50 දෙනාගෙන් විශේෂිත තොරතුරු ඇතුලත් 10 දෙනෙකු පිළිබඳව සිද්ධි අධ්‍යයන කරන ලදී. මෙහිදී විශේෂ කරුණු

ලෙස කුඩා දරුවන් සිටීම, ගණිකා වෘතියේ යෙදීම, හිංසන වලට ලක්වී තිබීම ආදී කරුණු සැලකිල්ලට ගන්නා ලදී. මේ තුලින් මෙම කණ්ඩායම මත් ද්‍රව්‍ය වැරදි වලට යොමුවූ ආකාරය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගන්නා ලදී. ඒ අනුව ඔවුන්ගේ දුගී බව, උප සංස්කෘතියක් තුල ජීවත් වීමෙන් මත් ද්‍රව්‍ය අපහරණය වරදක් ලෙස නොසැලකීම, වැරදි කිරිමට ඔවුන් තුල ලැජ්ජාවක් හෝ බියක් නොවීම ආදී විශේෂ කරුණු අවබෝධ කරගන්නා ලදී.

මෙයට අමතරව එම සමාජයේ මෙම සමාජ ගැටළුව පිළිබඳ සංවේදී නිලධාරීන් සහ ප්‍රභූන් වෙතින්ද ඔවුන්ගේ නිරීක්ෂණ ලබා ගන්නා ලදී. මෙම පිරිස ලෙස පූජ්‍ය පක්ෂය, පොලිස් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, වෛද්‍ය වරුන්, ඖෂධ වේදීන් සහ බන්ධනාගාර නිලධාරීන් අවධානයට ලක්විය. මෙම පිරිස වෙතින් ලබා ගත් නිරීක්ෂණ තුලින්ද මෙම උප සංස්කෘතියේ මත් ද්‍රව්‍ය වැරදි වලට දුගී කාන්තාවන් සම්බන්ධ වී සිටීම, ඒ හා සම්බන්ධ වෙනත් පාර්ශවයන් සහ එහි විපාක විඳින්නන් හඳුනා ගත හැකි විය. මෙම නිබන්ධයේ විශ්ලේෂණ වලදී එම අයගේ අදහස් අන්තර්ගත කර ඇත. මෙහිදි මෙම ව්‍යාපාරය නිරුපද්‍රිතව පවත්වා ගෙන යාමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ දූෂිත තත්වය පිටු බලයක් සපයන ආකාරය පැහැදිලි විය.

මෙහිදී මෙම සමාජයේ කාන්තාවන් සෑම කල්හිම මත් ද්‍රව්‍ය වැරදි වලට අනියම්ව හෝ සහයෝගය දක්වා ඇති බව දැනගත හැකි විය. මත් ද්‍රව්‍ය ජාවාරම් වලින් ලැබෙන ආදායම් වලින් යැපීම, ඒ සඳහා විරුද්ධ නොවිම, සැමියා සිරගත වූ පසු හෝ මියගිය පසු එම ව්‍යාපාරය පවත්වා ගෙන යාම වැනි කරුණු මගින් මෙම ව්‍යාපාරයට කාන්තාවන් දායක වන ආකාරය පැහැදිලි විය.

එසේම මෙම උවදුර සමාජයෙන් ඉවත් කිරීමට නම් කුමන පියවර ගත යුතුද යන්නත් පර්යේෂණ ලාභීන්ගේ තොරතුරු වලින් සහ නිරීක්ෂකයින්ගේ තොරතුරු වලින් පැහැදිලි විය. ඒ අනුව මෙම උප සංස්කෘතියේ ස්ථාවර අංගයක් ලෙස මුල් බැස ගෙන ඇති මෙම උවදුර වෙනස් කිරීමට නම් මෙම උප සංස්කෘතිය වෙනස් කළ යුතු බවත්, නීතිය දැඩිව ක්‍රියාත්මක කළයුතු බවත් අවබෝධ විය. මෙහි දැඩිව විපාක විඳින්නන් ලෙස රටේ අනාගතය භාරගැනීමට සිටින ළමා පරපුර ඉදිරියෙන් සිටින බවද පැහැදිලි වූ අතර උක්ත ආකාරයට